# සාරාංශය

ප්‍රාග් කොමියුනිස්ට් අවධියේ ජීවත් වූ මිනිසුන් අතර සමාජ අසමානතා නො තිබූ බව සඳහන් වුව ද ඉතිහාසය පුරාම සමාජ අසමානතා පිළිබඳ ව අවධානය යොමු කර ඇත. සමාජ විද්‍යාවේ ආරම්භය සහ විකාශනය සමග සමාජ අසමානතා හැදෑරීම සඳහා සමාජ ස්තරායනය (Social Stratification) යන පදය භාවිතයට එක් විය. සමාජයක අසමානතාවල ස්වභාවය, හේතු සහ ප්‍රතිඵල විග්‍රහ කිරීම සමාජ ස්තරායනය මගින් සිදු කෙරේ. සමාජ ස්තරායනය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති න්‍යායන් මෙන් ම ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති අධ්‍යයන තුළින් ද හෙළි වන්නේ සමාජ ස්තරායනය ගොඩනැගීම කෙරෙහි බලපාන්නා වූ හේතූන් පිළිබඳ ව පොදු එකඟතාවයකට වඩා විවිධත්වයක් පවතින බවයි. මේ සන්දර්භය තුළ ඒ ඒ සමාජයන් හි සමාජ ස්තරායනය ගොඩ නැගීම කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීම සඳහා සමාජ විද්‍යාත්මක වටිනාකමක් ඇති බව පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ ධීවර ගමක පශ්චාත් සුනාමි සමාජ ස්තරායනය ගොඩනැගෙන ආකාරය සහ ඊට බලපාන සාධක පිළිබඳ ව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් නමැති මෙම අධ්‍යයනය ක්‍රියාවට නැගෙන්නේ ඉහත හේතුව නිසා ය. සුනාමි ව්‍යසනයත් සමග ග්‍රාමීය ධීවර සමාජයන් හි පැවති සමාජ ස්තරායනය බිඳ වැටුනු අතර එය අළුතින් සකස් වීමට වසර 7-8ක කාලයක් ගත විය. ඒ අනුව සුනාමියෙන් පසුව ග්‍රාමීය ධීවර ප්‍රජාව තුළ සමාජ ස්තරායනය ගොඩනැගෙන ආකාරය සහ ඒ කෙරෙහි බලපාන විවිධ සාධක මොනවාද යි විමසා බැලීම මේ පර්යේෂණ ගැටළුව මගින් අවධානයට ලක් විය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ග්‍රාමීය සමාජයේ සමාජ ස්තරායනය සකස් වීම කෙරෙහි බලපාන සමාජ ආර්ථික සාධක මොනවාද යන්න හඳුනාගැනීමයි. එම ප්‍රධාන අරමුණට අමතර ව මෙම අධ්‍යයනයේ උප අරමුණු 03ක් විය. ඒවා නම් වර්තමාන ග්‍රාමීය සමාජයේ සමාජ ස්තරායනය තුළ සමාජ චලනතාවයට ඇති හැකියාව සහ සීමාවන් හඳුනාගැනීම, අධ්‍යයනයේ අනාවරණ මගින් සමාජ ස්තරායනය පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රයට දායකත්වයක් ලබා දීම සහ පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ තුළින් උගත හැකි සමාජීය පාඩම් මොනවාද යන්න තේරුම් ගැනීම යනුවෙනි.

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාවැල්ල ධීවර ගම්මානය ආශ්‍රයෙනි. මේ ගම 2004 දෙසැම්බර් 26 වන දින සුනාමි ව්‍යසනයෙන් බරපතල හානි සිදු වූ ගමක් විය. මේ අධ්‍යයනයේ දී මානව විද්‍යාත්මක අධ්‍යයනවල දී භාවිත කරන ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යොදාගන්නා ලදී. මානව විද්‍යාත්මක අධ්‍යයනවල දී සුලභ ව යොදා ගනු ලබන ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්ම මෙම අධ්‍යයනයට ගැලපෙන ලෙස මෙහි ක්‍රමවේදය ලෙස යොදා ගැනුනි. මෙහි දී ප්‍රශ්න මාලාව, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, වත්කම් පෙළගැස්ම සහ ද්විතීයික මූලාශ්‍ර යන මෙවලම් යොදා ගනිමින් දත්ත රැස් කරනු ලැබීය.

මේ අධ්‍යයනයේ දී අදාල ග්‍රාමීය ධීවර ප්‍රජාව තුළ සමාජ ස්තර 5ක් හඳුනාගත හැකි විය.

1. ඇති-හැකි ස්තරය
2. ඇති-නො හැකි ස්තරය
3. හැකි ස්තරය
4. නැති-හැකි ස්තරය
5. නැති-නො හැකි ස්තරය

මෙම ස්තරායනය පිරමීඩාකාර ව්‍යුහයක් ලෙස හඳුනා ගතහැකි වූ අතර එහි ඉහළ ස්තරවලට වඩා පහළ ස්තරවල සාමාජිකයින් සංඛ්‍යාව වැඩි විය. ඇති හැකි ස්තරය නියෝජනය කළේ පාරම්පරික සමාජ ගරුත්වයක් ඇති ධනවත් ප්‍රභූ පිරිසයි. මොවුහු ධීවර කටයුතුවල නොයෙදෙන නමුත් බහුදින ධීවර යාත්‍රා, මාළු ප්‍රවාහනය කරන ලොරි රථ ආදියේ අයිතිකරුවන් වූහ. පාරම්පරික සමාජ ගරුත්වයක් නැතත් දිගුකලක් තිස්සේ ටිකෙන් ටික උපයාගත් ධනය හේතුවෙන් උඩුකුරු චලනතාවයේ යෙදෙමින් ධනවත් වූ පිරිසක් ඇති - නොහැකි ස්තරය නියෝජනය කළේය. මොවුන්ගේ මුල් පරම්පරාව පාරම්පරික මාදැල් ධීවර කර්මාන්තයේ යෙදුනද දෙවන පරම්පරාව යාන්ත්‍රික ධීවර කටයුතු හා වෙළඳාම හරහා ධනවත් වූ අය විය. මෙම ස්තරය වැඩියෙන් උපයන අඩුවෙන් වියදම් කරන පිරිසකි. මොවුන් සතුව දේශපාලන බලයක් හෝ මැර බලයක් නොවීය.

හැකි ස්තරය නම් වූ මෙම තෙවන ස්තරය රාජ්‍ය හා පෞද්ගලික රැකියාවල යෙදෙන හා එම රැකියාවලින් විශ්‍රාම ගිය අයගෙන් යුක්ත විය. සැලකිය යුතු ස්ථාවර වත්කම් ප්‍රමාණයක් හා නිශ්චිත මාසික වැටුපක්ද සහිත මෙම ස්තරය ඉහළ සමාජ ගරුත්වයක් ඇති පිරිසකි. ඉහළ දේශපාලන බලයක් නොමැති වුවද මොවුන් සතුව දේශපාලන සබඳතා පැවතුනි. හැකි ස්තරයේ පවුල් අතර ගම හැර යාමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකි විය.

සිව්වන ස්තරය වූ නැති - හැකි ස්තරය සතුව සැලකිය යුතු ආර්ථික ශක්තියක් නොමැති වුවද මොවුන් සතුව යම් දේශපාලන බලයක් හා සමාජ ගරුත්වයක්ද පැවතුනි. ඒ මෙම පිරිස ගමේ ඉහළම සමාජ ස්තරය වූ ඇති – හැකි ස්තරයේ අනුගාමිකයින් වූ නිසාය. මෙම ගමෙහි සමාජ ස්තරායනය පිළිබඳ වූ පහළම ස්තරය නියෝජනය කළේ නැති – නොහැකි ස්තරයයි. අනෙක් ස්තරවලට සාපේක්ෂව විශාලම පිරිසක් නියෝජනය කළ මේ ස්තරය ආර්ථික ශක්තිය, සමාජ ගරුත්වය සහ බලය යන අංශ තුනෙන්ම පහළ කණ්ඩායමක් විය. බෙහෙවින් දිළිඳු සාමාජිකයින් නියෝජනය කළ මේ ස්තරයේ වැඩිදෙනෙක් කුලී ශ්‍රමිකයින් ලෙස එදාවේල උපයාගත් අය විය.

මෙම සමාජ ස්තරායතනය සකස්වීම කෙරෙහි ආර්ථික සාධක පමණක් නොව සමාජ ගරුත්වය සහ බලය වැදගත් වී ඇති බව නිගමනය කළ හැකි විය. බලය යටතේ ප්‍රචණ්ඩත්වය හෝ මැර බලයද දේශපාලන බලයද වැදගත් වී ඇති බව නිගමන අතර කැපී පෙනේ. මුල් කාලවල මැර බලය හෝ ප්‍රචණ්ඩත්වය වැදගත් වුවද පසුකාලවල එය දේශපාලන බලය වැදගත්වීම දක්වා පරිවර්තනය වී තිබේ.